දෙක බැගින්ද, බිත්තර දෙක බැගින් තිබුණු කූඩු වලින් එක බැගින්ද බිත්තර 39 ක් එකතු කර ගැනීමට හැකිවිය.


මේ අයුරින් දිනකට බිත්තර 25,000 ක් පමණ එකතුවේ. මෙම බිත්තරයක් සාමාන්‍යර කිකිළි බිත්තරයකට වඩා කුඩාය. කිකිළි බිත්තරයක් ග්‍රෑම් 65 ක් පමණ බරින් යුක්ත වන අතර මෙම බිත්තරයක් ග්‍රෑම් 40 ක් පමණ බරකින් යුක්තය. පෝෂණ ගුණයෙන් අධික මෙම බිත්තර සඳහා ඉහල ඉල්ලුමක් තිබේ. මේ වශයෙන් ගන්නා බව දළ ගණනය කිරීමකින් හෙළිවේ.

ක්‍රියාකාරකම් රාශියක් කර, අප සකස් කළ අධ්‍යයනයේ සවිස්තර වාර්තාවක් උපදේශකවරයාට භාරදී සැමටම ස්තුති කළ අපි, පස්වරු දෙකට පමණ තිබුණු ගුවන් යානයෙන් ආපසු අප පදිංචි මාහේ දිවයිනට පැමිණියෙමු.

ස්වභාව ධර්මය විසින් නිර්මාණය කර


බිත්තර සහිත කූඩුවක්

බිත්තර ලංකාවේ තිබෙන වටු බිත්තර වලට බොහෝ දුරට සමානය. බිත්තරයේ දම් පැහැති තිත් තිබේ. දූපතේ කාර්යාලයේ සහ වෙනත් අමුත්තන් ගැවසෙන ස්ථානවල තම්බන ලද මෙම බිත්තර නොමිලයේ ලබාගැනීමට තබා තිබීම තවත් විශේෂ


සූටි ටර්න් ලිහිණියෙකු බිම කූඩුවක

දෙයකි.

මුහුදු ලිහිණියන්ගේ ආහාරය, අවට නොගැඹුරු මුහුදේ බහුලව වෙසෙන හාල්මැස්සෙකුට වඩා තරමක් විශාල මත්ස්‍යව විශේෂයකි. කුරුල්ලා සහ කිරිල්ලිය මාරුවෙන් මාරුවට පියාඹා ගොස් මුහුදේ කිමිදී මත්ස්‍යයා බැගින් අල්ලා ගෙනැවිත් පැටවුන්ට කවති. නිරීක්ෂණය කළ පැයක් ඇතුළතදී එක කුරුළු යුවලක් පැටවුන් සඳහා ගෙනෙන ලද උපරිම මසුන් සංඛ්‍යායව 8 ක් විය. අවමය 3 කි. උපදේශක වරයා ගෙන් ලැබුණු දත්ත වලට අනුව මෙම මත්ස්‍යයකුගේ සාමාන්‍ය බර ග්‍රෑම් 10 ක් පමණ වේ. මේ අනුව එක් කුරුළු පැටවෙකු දිනකදී මසුන් ග්‍රෑම් 200 පමණ ආහාර තිබෙන, එකිනෙකට සාපේක්ෂව ක්‍රි යාත්මක වන, භෞතීය සහ ජෛව සම්බන්ධතා කිහිපයක් මෙම සංසිද්ධියෙන් අවබෝධ කරගත හැකිය. ඒවා මෙසේ දක්වමි.

1. පෘථිවියේ උතුරුකරයේ ජීවත්වන බොහෝ පක්ෂීන්ට අභිජනනය කර පැටවුන් හදා වඩා, වර්ගයාගේ පැවැත්ම ස්ථිර කිරීම සඳහා දේශගුණය එරෙහි වේ. මේ නිසා එම පක්ෂීහු ඝර්ම කලාපීය ප්‍රදේශ වලට පර්යටනය (migration) වෙති. මෙම දිගු ගමනට අහසේ තරු රටා, සූර්යයා සහ අනිකුත් ග්‍රහ වස්තු වල පිහිටීම සහ එම සතුන්ගේ ශාරීරික රසායනික ද්‍රව්‍යද ක්‍රියාත්මක වන බව සොයාගෙන තිබේ.

2. එසේ පැමිණෙන පක්ෂීන්ට සාගරය මැද තනිවූ නිස්කලංක, හොඳින් සූර්ය රශ්මිය ලැබෙන සතුරන් නොමැති දූපත් තිබේ.

3. මෙම දූපත් වටා ඇති නොගැඹුරු මුහුදේ


කුරුළු පැටව්

සූර්යයාගෙන් ආලෝක ශක්තිය ලබාගෙන සුවිශේෂී මුහුදු හරිත ඇල්ගී බහුලව වැඩේ.

4. මුහුදු ඇල්ගී ආහාරයට ගන්නා කුඩා මසුන් අති විශාල ප්‍රමාණයක් එම නොගැඹුරු ජලයේ වර්ධනය වෙති.

5. එම මසුන්, දූපතට තාවකාලිකව පැමිණෙන මිලියන හත අටකට වැඩිවන කුරුල්ලන් සහ පැටවුන්ගේ ප්‍රධාන ආහාරය වේ.

6. කුරුල්ලන් දමන වැඩිපුර බිත්තර මිනිසාගේ ආහාරය වේ.

7. ඔක්තෝබර් මැද පමණ වනවිට දෙමාපිය කුරුල්ලෝ, අලුතින් හදා වඩා ගත් පැටවුන්ද සමග ආපසු සිය ගම් බිම් බලා යාමට පිටත් වෙති. මේ ගමනේදී දෙමාපියන්ගෙන් එක්තරා ප්‍රතිශතයක් ස්වභාවික මරණයට පත්වෙති. කෙසේ වෙතත් කුරුළු ගහණයේ සංයුතිය ස්ථායි තත්ත්වයක පවතී.

8. කුරුල්ලන් ගිය පසුද ඔවුන් විසින් ඉතිරි කර යන කුරුළු බෙටි වලින්ද රටට හොඳ ආදායමක් ලැබේ. මෙම කුරුළු පොහොර ගුවනෝ (guano) යන නමින් හැඳින්වේ. කුරුළු දිවයිනේ වසරකට ගුවනෝ මෙට්රියක් ටොන් 30,000 ක් පමණ එකතුවන බව ගණන් බලා තිබේ.

සූර්යයාගෙන් ලැබෙන ශක්තිය, මුහුදු ඇල්ගී, මසුන් සහ කුරුල්ලන් හරහා බිත්තර ලෙස මිනිසාට නොමිලයේ ලබාදෙන මෙම සංසිද්ධිය, ස්වභාව ධර්මයේ අපූරු නිමැවුමක් නොවේද ?

එය සරල ආහාර දාමයක් ලෙස මෙසේ දැක්විය හැකිය.




මෙහි ශක්ති ප්‍රභවය සූර්යයායි.

සූර්යයාගේ ශක්තිය මිනිසාට කෙලින්ම ලබා ගත නොහැකිය. හරිත වර්ණ මුහුදු ඇල්ගී වල ඇති හරිතප්‍රද මගින් ග්‍රහණය කර ගන්නා සූර්යය ශක්තිය, එම ඇල්ගී ආහාරයට ගන්නා කුඩා මසුන් ඔස්සේ මුහුදු ලිහිණියන්ට ලැබේ. එම ශක්තියෙන් යම්කිසි ප්‍රතිශතයක්, මහුදු ලිහිණියන්ගේ බිත්තර වල තැන්පත් වේ. බිත්තර මිනිසාගේ ආහාරය වූ විට එම ශක්තිය නිරායාසයෙන්ම මිනිසාට ලැබේ. මිනිසාට කෙලින්ම සූර්යයාගෙන් ලබාගත නොහැකි ශක්තිය අහාර දාමය ඔස්සේ ගොස් ඔහුට ලබාදීම සඳහා ස්වභාවධර්මය කෙතරම් නිර්මාණශීලි වීද යන්න වටහා ගැනීමට මෙය හොඳම උදාහරණයකි.

(ඡායාරූප, ස්තුති පූර්වකව, අන්තර්ජාලයෙනි.)

**Alpha Academy 2017**
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

**To request an application, please text student name, Class and school to 0457908918**